# දූතයා (රාජ්‍ය මූලය) හා චරපුරුෂයාට රාජ්‍ය පාලන සංවිධානය තුළ හිමි වූ වැදගත්කම පිළිබඳ භාරතීය මූලාශ්‍රය ඇසුරෙන් කරනු ලබන විමර්ශනාත්මක අධ්‍යයනයක්.

ආර්.එම්.ජී. වසන්ත දිසානායක

## Abstract

The Sanskrit literal resources give accounts that there was a great position in the ancient state for envoy who establishes interrelationship between the state and the community as well as spy who supplies evidence through the intelligence information for the protection of country. In the modern world, ambassador and intelligence service of a country represent the above mentioned ancient envoy and spy. In the ancient state as well as in the modern government these appointments have acceptable positions, so, in the research it studies, their duties, qualification, skills and characters etc.

In the ancient state the main role of the envoy was to establish relationship between the state and community and to make separation among some communities through Sandhi and Vigraha. On the other hand, supplying the evidence about the strength and weakness of enemies of the country was another



duty of him. The duty of the spy was to find out intelligence information of enemy countries and made the protection of one's own country. Thus, in the research it illustrate the qualifications and activities of envoy and spy on ruling constitution and disguising and secret discussion etc. related to the above two appointments with reference to the Sanskrit sources.

***Keywords :*** *AEnvoy, Spy, Sandhi, Vigraha, disguising, secret discussion*

## හැඳින්වීම

හැඳින්වීම හූ ලෝක හූ දේශපාලන සන්දර්භය තුළ රාජ්‍ය අන්තර් සබඳතා නිර්මාණය කිරීමේ මූලික වගකීම හා කාර්යභාරය පැවරී ඇත්තේ රාජ්‍ය මූලය හෙවත් දූතයා නමින් හඳුන්වනු ලබන රාජ්‍ය නිලධරයාට ය. රාජ්‍යය හා එහි වැසියන් පාලකයාගෙන් අපේක්ෂිත වැදගත් ම කරුණ වනුයේ රාජ්‍යය මෙන්ම සිය ජීවිත සුරක්ෂිත කිරීමයි. පාලකයා රාජ්‍ය ආරක්ෂාව ගොඩනැගීම සම්බන්ධයෙන් තීන්දු තීරණවලට එළඹෙනුයේ සියලු ක්ෂේත්‍ර ආවරණය කරමින් රහස්‍ය තොරතුරු රැස්කරන චරපුරුෂයන්ගෙනි. රාජ්‍ය නමැති ආයතනය වඩාත් සංවිධානාත්මක ලෙසින් පවත්වාගෙන යාම සඳහා මේ කියනු ලබන චරිත ද්විත්වය අතිශයින් වැදගත් වන බැවින් ඔවුන්ට රාජ්‍ය පාලන සංවිධානය තුළ ගෞරවනීය බවක් මෙන්ම වැදගත්කමක් හිමි වී තිබේ. මොවුන් පාලන සංවිධානය තුළ ක්‍රියාත්මක වූයේ කෙසේ ද? එම තනතුරු දැරීම සඳහා ඔවුන් විසින් සපුරාගත යුතු සුදුසුකම් හා චරිත ලක්ෂණ කවරේ ද? රාජ්‍ය පාලන සංවිධානය තුළ ඔවුන්ට හිමිව තිබූ වැදගත්කම කෙබඳු වී ද? යන්න භාරතීය සංස්කෘත සාහිත්‍යය මූලාශ්‍රය කරුණු රැසක් අනාවරණය කරණ බැවින් තත් මූලාශ්‍රය ඇසුරෙන් මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය සිදු කෙරේ.

දූත නිලයට පැවරුණු ප්‍රධාන කාර්යය වූයේ පාලන සංවිධානය තුළ 'සන්ධි හා විග්‍රහ' යන ක්‍රමවේද මගින් එකිනෙක රාජ්‍යයන් අතර මෙන් ම පුද්ගල කණ්ඩායම් අතර සමගි සන්ධාන හා භේද භින්නතා වර්ධනය කිරීමයි. එම කාර්යයට අමතරව මිතුරු, සතුරු රාජ්‍යයන්හී විවිධාකාර වූ දුර්වලතා නිරීක්ෂණය කොට වාර්තා සැපයීම ද ඔහු අතින් සිදු විය. රාජ්‍ය අන්තර් සම්බන්ධතාවලදී දූතයා රාජ්‍යය

නියෝජනය කරන බැවින් එම නිලය රාජ්‍යය හා සම්බන්ධ සියලු ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් අවබෝධයක් මෙන් ම දැනුමක් ඇති තැනැත්තන් කෙරෙහි ම ලබාදිය යුතු බව මූලාශ්‍රය අධ්‍යයනයෙන් පැහැදිලි වේ. චරපුරුෂයන් විවිධාකාර වූ වේෂධාරීන් ලෙස කටයුතු කරමින් රාජ්‍ය ආරක්ෂාව ගොඩනැගීම සඳහා බුද්ධි තොරතුරු එක්රැස් කළ බැවින් රාජ්‍ය පාලන සංවිධානය තුළ ඔවුන්ට ද විශාල පිළිගැනීමක් ලැබුණි. රජුගේ දිනචරියාව චරපුරුෂයන් සමඟ සිදු කළ බුද්ධි තොරතුරු විශ්ලේෂණයෙන් පසුව ආරම්භ වූ බව පෙන්වාදීමෙන් පැහැදිලි වනුයේ ඔවුන්ගේ තොරතුරු රාජ්‍ය ආරක්ෂාවට එතරම්ම වැදගත් වන බව ය. දූතයකු හා බුද්ධි නිලධාරියෙකු ලෙසින් රාජ්‍ය සේවයට ප්‍රවේශ වීමේදී සපුරාගත යුතු සුදුසුකම්, වර්ධනය කරගත යුතු ගති ලක්ෂණ හා ගුණාංග, චරපුරුෂ සේවය හා සම්බන්ධ වේෂධාරිත්වයේ විවිධත්වය ආදි කරුණු රැසක් සංස්කෘත සාහිත්‍යය මූලාශ්‍රයෙන් අනාවරණය කරගත හැකිය.

**පර්යේෂණ ගැටලුව -**

භාරතීය සංස්කෘත සාහිත්‍යය මූලාශ්‍රයෙන් නිරූපිත දූතයා හා චරපුරුෂයාගේ ක්‍රියාකාරිත්වය අන්තර් භූ රාජ්‍ය දේශපාලන සබඳතා හා රාජ්‍ය ආරක්ෂාව ගොඩනැගීමට උපකාරී වේ ද?

**පර්යේෂණ අරමුණ -**

අන්තර් භූ රාජ්‍ය දේශපාලන සබඳතා වර්ධනය කිරීමේදී හා රාජ්‍ය ආරක්ෂාව ගොඩනැගීමේදී දූතයා හා චරපුරුෂය යන නිල පද්ධතීන්ට පාලන සංවිධානය තුළ හිමි වැදගත්කම අනාවරණය කරගැනීම.

දූත කාර්යය හා චරපුරුෂ සේවයට සම්බන්ධ වන චරිත සපුරාගත යුතු කුසලතා හා චරිතයෙන් පිළිබිඹු කෙරෙන ලක්ෂණ කවරේද යන්න අනාවරණය කරගැනීම.

**පර්යේෂණ ක්‍රමවේදය** - මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය **මහාභාරතය, අර්ථශාස්ත්‍රය, නීතිශාස්ත්‍රය, මනුස්මෘතිය හා යාඥවල්ක්‍යස්මෘතිය** ආදි සංස්කෘත සාහිත්‍යය මෙන්ම සංස්කෘත උපදේශ සාහිත්‍යය මත පදනම්ව ඇති බැවින් තත් මූලාශ්‍රය කරුණු



සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීම මෙන්ම අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙසින් පෙන්වාදිය හැකිය.

**සාකච්ඡාව**

**දූතයා හෙවත් (රාජ්‍ය මූලය) පිළිබඳ මූලාශ්‍රය විග්‍රහය.**

රාජ්‍යතාන්ත්‍රික සබඳතාවන්ගෙන් බැහැර වූ භූ දේශපාලන සහයෝගිතා රහිත රාජ්‍යයක් නූතන ලෝකයේ නැති තරම් ය. වර්තමාන තානාපති සේවය හා සමාන තත්ත්වයක් අතීත දේශපාලන ලෝකයේ ප්‍රකට නොවූව ද දූත කාර්යය මැනවින් ක්‍රියාවට නැංවූ රාජ්‍ය නිලධාරීන් සහිත අන්තර් භූ දේශපාලන සංවිධානයක් අතීතයේ ද ක්‍රියාත්මක වූ බව සංස්කෘත සාහිත්‍යය මූලාශ්‍රයෙන් අනාවරණය කරගත හැකිය. විවිධ රාජ්‍යයන් හා පුද්ගල කණ්ඩායම් අතර අන්තර් සහයෝගිතා ඇති කරමින් තත් රාජ්‍යයන්හි මෙන් ම පුද්ගල කණ්ඩායම්වල ප්‍රගමණය සඳහා සිය දායකත්වය උපරිමයෙන් ක්‍රියාවට නැංවූ දූත නිලධාරියා පිළිබඳව තත් මූලාශ්‍රය විග්‍රහය කෙබඳු වී ද යන්න මෙයින් අධ්‍යයනයට බඳුන් වේ.

සිය රාජ්‍යයේ දේශපාලන ප්‍රතිපත්තීන් මෙන් ම ආර්ථික, සංස්කෘතික හා සමාජ තත්ත්වයන් අනෙකුත් රාජ්‍යයන් වෙත ගෙන යන ප්‍රධාන වාහකයා වන දූත නිලධාරියා රාජ්‍යයේ අනෙකුත් නිලධාරීන්ට සාපේක්ෂව සිය රාජ්‍යය වෙනුවෙන් විශාල සේවාවක් සිදු කරයි. ඔහු අතින් සිය රාජ්‍යයට සිදුවන සේවාව නිසා ම රාජ්‍ය සංවිධානය හා අන්තර් භූ දේශපාලනයේ ඔහුට හිමි වන ගෞරවය ද සුළුපටු නොවේ. ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය නියෝජනය දූත නිලධාරියා මත පදනම්ව ඇති බැවින් ඔහුට සිය රාජ්‍යයේ දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික ආදි සමස්ත ක්ෂේත්‍ර පිළිබඳව මෙන් ම සියලු තත්ත්වයන් පිළිබඳව මනා අබෝධයක්, කියවීමක් මෙන් ම දැනුමක් ද තිබිය යුතු ය. පුළුල් වපසරියක පැතිරුණු ඔහුගේ අවබෝධය හා දැනුමත්, රාජ්‍යයේ අන්තර් සම්බන්ධතා ඔහු මත ම පදනම්ව ඇති බැවිනුත් ශ්‍රේෂ්ඨ බුද්ධිමතුන් හා විද්වතුන් දූතයා යනු රාජ්‍යයේ මූලය ලෙසින් හඳුන්වා දී තිබේ (මහාභාරත ශාන්ති පර්වය, 2006: අධ්‍යාය 84. පි. 243).

රාජ්‍ය නිලතල පද්ධතියේ ඉහළ වටිනාකමක් සහිත නිලයක් වන දූත නිලධරයෙකු වීම සඳහා සපුරාගත යුතු සුදුසුකම් හා වර්ධනය කරගත යුතු ගුණාංග කවරේද යන මූලාශ්‍රය විග්‍රහයට අනුව දූතයා; කුලීන, සිල්වත්, කථාවට දක්‍ෂ, ප්‍රියවචන කථාකරන, කියන දේ කරන, මනා සිහියකින් පිරිපුන් අයෙක් විය යුතු ය (**මහාභාරත ශාන්ති පර්වය, 2006: අධ්‍යාය 86. පි. 247).** ශුක්‍ර නම් න්‍යායාචාර්යවරයාට අනුව දූතයා; සංකේත, ආකාර හා අදහස් පිළිබඳ දැනුමෙන් ද, ස්මෘතිමත් බවින් හා දේශය හා කාලය පිළිබඳ දැනුමෙන් ද පෝෂණය විය යුතු ය. එම කුසලතා හා ගුණාංගයන්ට අමතරව රහස් සාකච්ඡා පිළිබඳ අවබෝධයත්, වචනයේ දක්‍ෂ බවත්, නිර්භීතකමත් ඔවුන් තුළ තිබිය යුතු ය. 'ඉංගිතාකාර චෙෂ්ටඥඃ ස්මෘතිමාන්දේශකාලවිත් - ෂාඩ්ගුණ්‍ය මංත්‍රිවද්වාග්මී වීතභීර්දූත ඉෂ්‍යතෙ' (**ශුක්‍රනීති, 1952: අධ්‍යාය 2. ශ්ලෝක 86)** මනා සිහිය හෙවත් ස්මෘති බව, කථාවට දක්ෂ බව දූතයාගෙන් පිළිබිඹු විය යුතු බව මූලාශ්‍රය ද්විත්වයේ ම පිළිගැනීමයි. **මහාභාරතය** දූතයාගේ කුලීන බව හා සිල්වත් බව ඉස්මතු කරන විට **ශුක්‍රනීතිසාරය** අගයනුයේ රහස් සාකච්ඡා පිළිබඳ ඔහුගේ අවබෝධය හා ඔහු සතු නිර්භීත බවයි.

කෞටිල්‍යට අනුව නිසෘෂ්ටාර්ථ, පරිමිතාර්ථ, ශාසනහර යනුවෙන් දූතයා තෙවැදෑරුම් ය. ඇමැතිවරයකු කෙරෙහි උපලක්‍ෂිත සියලු ගුණාංග කිසියම් දූතයකු කෙරෙහි පිහිටියේ ද හේ නිසෘෂ්ටාර්ථ නම් වන බවත්, එම ගුණාංගයන්ගෙන් සතරෙන් කොටසක් ඇත්තා පරිමිතාර්ථ නම් වන බවත්, ඇමැති ගුණාංගයන්ගෙන් අඩක් ඇත්තා ශාසනහර නම් වන බවත් කෞටිල්‍යගේ අදහසයි. **(අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2),** 2003: අධිකාර 1. අධ්‍යාය 16. ශ්ලෝක 2 - 4) සාමාජික ව්‍යවස්ථාවට මූලිකත්වය දෙන, කාර්‍යයන්ට අනුරූපව ත්‍යාග ජීවිතයක් ගත කරන, උගත්, චින්තනශීලී, උත්සාහවන්ත, අලසකමෙන් තොර, කාර්‍යයෙහි දක්‍ෂ, (**මනුෂ්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, 2001: සත්වන අදියර. ශ්ලෝක 58 - 61)** හැකියාව හා බුද්ධිය, (**අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 8. ශ්ලෝක 27 - 29)** වංශ පරම්පරාවෙන් ආ, ශාස්ත්‍රය දත්, ශූර, ඉලක්කයේ දක්‍ෂ, මනා කුලයක උපන්, සුපරීක්‍ෂාකාරී, 'මෞලාඤ්ඡාස්ත්‍රවිදඃ ශූරාංල්ලබ්ධක්‍ෂාන් කුලොද්භවාන් සචිවාන් .... ....... ප්‍රකුර්වීත පරීක්‍ෂිතාන්' (**මනුස්මෘතිය සහ මානවශිෂ්ටාචාරය, 2001: සත්වන අදියර. ශ්ලෝක 54)** ආදි වශයෙන් සුදුසුකම් හා



ගුණාංග සමුදායක් ඇමැතිවරයා කෙරෙහි උපයුක්ත බව පෙරදිග මූලාශ්‍රය විස්තරයන්ගෙන් පැහැදිලි වේ. කෞටිල්‍යගේ ඉහත අදහස් දැක්වීමෙන් පැහැදිලි වනුයේ ඇමැති පදවිය සඳහා කිසියම් අයෙකු සපුරාගත යුතු ගුණාංග දූත නම් නිලධාරියා කෙරෙහිද පිළිබිඹු විය යුතු බව ය. ඇමැතිවරයාට සිය රාජ්‍යය තුළ කිසියම් වැදගත්කමක් හා පිළිගැනීමක් වේ ද ඒ හා සමාන තත්ත්වයක් දූත නම් නිලයට ද සිය රාජ්‍ය තුළ හිමි බව මෙයින් අර්ථගැන්වේ.

මනුගේ අර්ථ දැක්වීමට අනුව සියලු ශාස්ත්‍රයෙහි විශාරද වූ, සියලු ආකාරයේ සංකේත පිළිබඳ දැනුමක් ඇති, හැසිරීම් රටාවෙන් හා ක්‍රියාකාරකම් මත අන්‍යන්ගේ අදහස් දැන ගැනීමේ හැකියාවක් ඇති, පිවිතුරු, දක්‍ෂ, කුලීනයෙක් ම දූත කාර්‍යයෙහි යෙදවිය යුතු ය. 'දූතං චෛව ප්‍රකුර්වීත සර්වශාස්ත්‍රවිශාරදම් - ඉඞ්ගිතාකාරචේෂ්ටඥං ශුචිං දක්ෂං කුලෝද්ගතම්' (**මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, 2001: සත්වන අදියර. ශ්ලෝක 63)** මේ කියනු ලබන ගුණාංගයන්ට අමතරව කාර්‍යයෙහි ඇලුණු, පිරිසිදු චරිතයක් ඇති, දක්‍ෂ, ස්මෘතියෙන් යුක්ත, දේශය හා කාලය පිළිබඳ දැනුමක් ඇති, නිරෝගි ශරීරයක් ඇති, නිර්භය, වචනයේ දක්‍ෂ 'අනුරක්තඃ ශුචිර් දක්‍ෂඃ ස්මෘතිමාන් දෙශකාලවිත් - වපුෂ්මාන් වීතභීර් වාග්මී දූතො රාඥඃ ප්‍රශස්‍යතේ' (**මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, 2001: සත්වන අදියර. ශ්ලෝක 64)** පුද්ගලයා ම රාජ දූතයෙකු කළ යුතු බව මනුගේ අදහසයි. දූතයා සම්බන්ධව **මනුස්මෘතිය** ඉදිරිපත් කරන කරුණු **මහාභාරතයේ** හා **ශුක්‍රනීතියේ** එන බොහෝ කරුණු හා සමපාත වන බව පෙනේ. ඉහත මූලාශ්‍රය ද්විත්වයේ සඳහන් කරුණුවලට වඩා **මනුස්මෘතියේ** සඳහන් වන එක ම කරුණ වනුයේ 'නිරෝගි ශරීරයක්' ඇති තැනැත්තා ද එයට සුදුසු බව කීම පමණි.

ඉහත සඳහන් කළ ගුණාංගයන්ට අමතරව සන්ධි, විග්‍රහ පිළිබඳ දැනුම ඇති, අවස්ථාවට අනුව කටයුතු කරන, දක්‍ෂ, අනාගතය පෙනෙන, ධර්ම, අර්ථ හා කාමය මගින් ද, පෙළඹවීමෙන් සතුරු වසඟ යට නොයන, දැඩි තීරණ ගැනීමේ ශක්තිය ඇති අයෙකු දූත කාර්‍යයේ යෙදවීම වඩාත් සුදුසු බව 'සන්ධිවිග්‍රහකාලඥාන් සමර්ථානායතික්ෂමාන් - පරෛරහාර්යාඤ් ශුද්ධාංශ්ච ධර්මතඃ කාමතොර්ථතඃ' (**පඤ්ඤාකිත්ති හිමි, 2001: 59, 60)** සංස්කෘත සාහිත්‍යයේ එන සඳහනකින් ප්‍රකට වේ. සන්ධි, විග්‍රහ පිළිබඳ දැනුම දූත කාර්‍යයෙහි නියුතු නිලධාරියා සපුරාගත

යුතු ම සුදුසුකමකි. රාජ්‍යයන් අතර මෙන් ම පුද්ගල කණ්ඩායම් අතර සමගිය මෙන් ම භේදය ඇති කිරීම දූත නිලධාරියාගේ කාර්යයන් අතර ප්‍රමුඛ වූවක් වන බැවින් ඔහු සන්ධි, විග්‍රහ පිළිබඳ දැනුමෙන් පෝෂණය විය යුතු ම ය. මීට අමතරව සිය මතය යුක්තීන් මගින් සනාථ කිරීම සඳහා අවැසි සියලු ශාස්ත්‍ර පිළිබඳ දැනුම ඇති, ධනය පිළිබඳ සියලු ආශාවන්ගෙන් බැහැර වූ, භාණ්ඩාගාරයේ අභිවෘද්ධිය සඳහා දක්ෂතා ඇත්තෙකු 'සමාහර්තුං ප්‍රකුර්වීත සර්වශාස්ත්‍රවිපශ්චිතඃ - කුලීනාවෘත්ති සම්පන්නාන් නිපුණාන් කොශවෘද්ධයෙ' **(පඤ්ඤාකිත්ති හිමි, 2001: 60)** දූතයකු ලෙස පත්කර ගැනීම වඩාත් සුදුසු බව සඳහන් ය. තමන් දරන මතවාදය යුක්ති සහගතව අන්‍යයන් ඉදිරියේ සනාථ කිරීමේ හැකියාව සියලු ශාස්ත්‍ර පිළිබඳ දැනුමෙන් ම පෝෂණය කරගත යුතු තත්ත්වයකි. ඉදින් එවැනි හැකියාවක් ඇති තැනැත්තාට සිය රාජ්‍යයේ භාණ්ඩාගරයේ අභිවෘද්ධිය වෙනුවෙන් දායකත්වය සැපයීම අපහසු වන්නේ නැත. මෙම මූලාශ්‍රය ඉගැන්වීම්වලින් පැහැදිලි වනුයේ දූතයා යනු සමස්තය පිළිබඳ දැනුමෙන් මෙන් ම අවබෝධයෙන් පෝෂිත අයෙකු විය යුතු බව ය.

දූතයා පිළිබඳව තව දුරටත් අදහස් දක්වන සංස්කෘත සාහිත්‍යය මූලාශ්‍රය අයවැයෙහි දක්ෂතා සහිත, ගණිතය පිළිබඳ දැනුමෙන් පෝෂිත, ලොල් බවින් තොර, ධර්මය බුද්ධිය කොට ඇති, සියලු කාර්යය හා අර්ථය පිළිබඳ විචාර බුද්ධියක් ඇති 'ආයව්‍යයස්‍ය කුශලාන් ගණිතඥාන ලොලුපාන් - නියෝජයෙද් ධර්මනිෂ්ඨාන් සම්‍යක් කාර්යාර්ථ චින්තකාන්' **(පඤ්ඤාකිත්ති හිමි, 2001: 60)** අයෙකු දූත කාර්යයෙහි යෙදවිය යුතු බව සඳහන් කර ඇත. අයවැයෙහි දක්ෂ බවත්, ගණිතය පිළිබඳ කුසලතාවයත්, සියලු කාර්යය හා අර්ථය පිළිබඳ විචාර බුද්ධියත් යනු දූතයා විසින් තත් තනතුර දැරීම සඳහා සපුරාගත යුතු සුදුසුකම් ය. ලොල් බවින් තොර වීම හා ධර්මය බුද්ධිය කොට වාසය කිරීම ඔහු සතු ගුණාංගයන් ය. මෙම කරුණුවලින් ප්‍රකට වනුයේ දූතයා රාජ්‍යයේ ආර්ථික කාර්යය සඳහා කිසියම් මැදිහත් වීමක් සහිත නිලධාරියෙකු බව ය. එසේම ඔහු සාමාන්‍ය බුද්ධියකට එහා ගිය විචාර බුද්ධියකින් ද පිරිපුන් තැනැත්තෙක් විය යුතු බව මෙයින් ප්‍රකට වේ.

දූතයා පිළිබඳව ප්‍රශංසාත්මකව කරුණු දක්වන මනු දූතයා ම සමාදානයත්, භේදයත්, මිනිසුන් අතරත ද්වේෂයත් ඇතිවන ආකාරයෙන් ක්‍රියා කරන බව පෙන්වා දෙයි **(මනුස්මෘතිය සහ**



**මානව ශිෂ්ටාචාරය, 2001: සත්වන අදියර. ශ්ලෝක 66).** රාජ්‍යය තුළ දූතයාගේ ක්‍රියාකාරිත්වය ඔහුට වැදගත් බවක් මෙන් ම සම්මානනීය බවක් ලබා දී ඇති බව ඉහත මූලාශ්‍රය විග්‍රහයෙන් ප්‍රකට කෙරේ. පාලන ක්‍රියාවලියේදී සිය අමාත්‍ය මණ්ඩලයෙන් පාලකයාට ලැබෙන සහාය වැදගත් වන්නේ යම්සේද එබඳු ම වැදගත්කමක් දූතකාර්යයේ යෙදෙන නිලධාරියාගෙන් ද ලැබේ. 'රාජ්‍යය හා දූතයාට සන්ධි හා විග්‍රහ යටත් වන්නේය' යනුවෙන් කරන සඳහනින් ම ඒ බව තවදුරටත් තහවුරු වේ. '... දූතෙ සන්ධිවිපර්යයෞ' **(මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, 2001: සත්වන අදියර. ශ්ලෝක 65)**

දූතයාගේ කාර්යභාරය පිළිබඳව අවධානය යොමු කරන කෞටිල්‍ය, සතුරාගේ රටට ගොස් උත්තර ප්‍රති උත්තරවලදී දුෂ්කරතා ඇති නොවන පරිදි තම ස්වාමියාගේ සන්දේශය සමඟ සම්බන්ධතා පැවැත් වීම ඔහු සතු වැදගත් ම කාර්යයක් ලෙස සඳහන් කරයි. සන්දේශ හුවමාරුවට අමතරව දූතයා විසින් සතුරු රජුගේ බලකොටු කෙතරම් ද, රාජ්‍ය සීමාව කවරේද, රටේ ආදායම් තත්ත්වය කෙබඳු වී ද, සාමාන්‍ය ජනයාගේ ජීවිකාව කෙබඳු තත්ත්වයක පවතී ද, සතුරු රජුගේ රාජ්‍යයෙහි ආරක්ෂක තත්ත්වය කවරාකාර ද, සතුරාගේ දෝෂ කවරේද ආදි කරුණු කෙරෙහි ද අධ්‍යයනයක් කළ යුතු යැයි සඳහන් කර ඇත **(අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 16. ශ්ලෝක 6 - 14).** දූතයා රජුගේ සන්දේශ ගෙන යන්නෙක් පමණක් නොව අසල්වැසි රාජ්‍යන්හී මෙන් ම සතුරු රාජ්‍යයන්හි රහස් සොයා බලා රජුට වාර්තා සපයන්නෙක් ද වන බව මෙයින් පැහැදිලි ය. රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාවන්ට අමතරව ඔහුගේ කාර්යය ද පුළුල් තලයක ක්‍රියාත්මක වූ බව ඉහත මූලාශ්‍රය විස්තරයන්ගෙන් පැහැදිලි වෙයි.

ඉහත මූලාශ්‍රය විග්‍රහයන්ට අනුව දූත කාර්යය හා බැඳුණු නිලය රාජ්‍ය යාන්ත්‍රණයේ ඉහළ ම තැනක ස්ථානගතව, සම්මානනීයත්වයෙන් පිදුම් ලද බව පැහැදිලි වෙයි. තනතුර හා බැඳුණු සුදුසුකම් කවරේද යන නිරීක්ෂණයෙන් ප්‍රකට වනුයේ දූත තනතුර සමස්තය පිළිබඳ දැනුමෙන් මෙන් ම අවබෝධයෙන් යුතු තැනැත්තා කෙරෙහි වූ බව ය. සන්ධි හා විග්‍රහ පිළිබඳ පුළුල් දැනුමට අමතරව අයවැය පිළිබඳ මෙන් ම ගණිතය පිළිබඳ දැනුම ද ඔහු සතු අතිරේක සුදුසුකම් ය. දූතයා සමගියට හා භේදයට පමණක් නොව ආර්ථිකයට ද එකසේ වැදගත් වන බව එයින් අර්ථගැන්වේ. දූත තනතුර අපේක්ෂිත තැනැත්තා විසින් වර්ධනය

කරගත යුතු ගති ලක්ෂණ හා ගුණාංග පිළිබඳව සංස්කෘත සාහිත්‍යය මූලාශ්‍රය විවිධත්වයකින් යුතුව කරුණු ගෙනහැර දක්වා ඇති අතර, ඒවායෙන් ප්‍රකාශිත පොදු තත්ත්වය වනුයේ දූතයා ද ඇමැතිවරයා මෙන් ගුණාංග හා ගති ලක්ෂණ සමුදායකින් සමන්විත විය යුතු බව ය. මූලාශ්‍රය විග්‍රහයට අනුව දූතයාගේ කාර්යභාරය හුදෙක් සම්බන්ධතා ඇති කිරීමට හා භේදතා වර්ධනය කිරීමට පමණක් සීමා නොවීය. සිය රාජ්‍යයේ සියලු තත්ත්වයන් අන්‍යයන් වෙත සම්ප්‍රේෂණය කිරීමත්, අසල්වැසි හා සතුරු රාජ්‍යයන්හී සියලු රහස් වාර්තා සිය පාලකයා වෙත ලබාදීමත් ඔහුගේ කර්තව්‍යයන් අතර වැදගත් ක්‍රියාවලීන් ලෙස පෙන්වාදිය හැකිය.

## චරපුරුෂයා හෙවත් බුද්ධි නිලධාරීන් පිළිබඳ මූලාශ්‍රය විග්‍රහය

අභ්‍යන්තරව මෙන් ම බාහිර වශයෙන් සිය රාජ්‍යයට එල්ල වන සතුරු උපද්‍රව, ආක්‍රමණ, කැරලි කෝලාහල හා කුමන්ත්‍රණ ආදිය මැඩ පවත්වා සිය ජනයාගේ ජීවිත සුරක්ෂිත කිරීම පාලකයා සතු ප්‍රධාන වගකීමකි. පාලකයා තමන්ට මෙන් ම සිය රාජ්‍යයට එල්ල වන ආක්‍රමණ, කුමන්ත්‍රණ මෙන් ම තමන්ගේ පාලනයට විරුද්ධව නැගී එන කැරලි කෝලාහල ආදිය කෙසේ ක්‍රියාත්මක වන්නේ ද, ඒ පසු පස කවර බලවේග ක්‍රියාත්මක වේ ද යන්න නිරීක්ෂණය කොට, ආරක්ෂාව පිළිබඳ ඉදිරි සැලසුම් මෙන් ම ක්‍රියාන්විතයන් දියත් කළ යුතු ය. ඒ සඳහා පාලකයාට පිටිවහලක් වනුයේ චරපුරුෂ හෙවත් බුද්ධි නිලධාරීන් විසින් සපයන බුද්ධි තොරතුරු ය. රාජ්‍යය නමැති ආයතනයට අතිශයින් වැදගත් වන චරපුරුෂයන්ගේ විවිධත්වය, ඔවුන්ගේ ගති ලක්ෂණ, ස්ථානගත කළ යුතු තැන්, රාජ්‍යය තුළ ඔවුන්ගේ කාර්යභාරය යනාදි ක්ෂේත්‍ර සංස්කෘත සාහිත්‍යය මූලාශ්‍රය ඇසුරෙන් විමර්ශනය කෙරේ.

## චරපුරුෂයන් ලෙස පත්කළ යුතු පිරිස, ඔවුන්ගේ විවිධත්වය හා ස්ථානගත කළ ක්ෂේත්‍ර

සංස්කෘත සාහිත්‍යය මූලාශ්‍රය අඥාන, අන්ධ, බිහිරි, කුසගින්න ආදි කෙලෙස් ඉවසන, බුද්ධිමත්, පරීක්ෂාවෙහි නිපුණ පුද්ගලයන් ද, සියලු ආකාරයේ ඇමැතිවරු හා නොයෙක් ආකාරයේ මිත්‍රයන් මෙන් ම පුත්‍රයන් ද ආදි කොට ඇති තෙවැදෑරුම් පිරිස් ගුප්තචරයන් ලෙස පත් කළ යුතු



යැයි සඳහන් කර ඇත. 'ප්‍රණිධීංශ්ච තතඃ කුර්යාජංඩාන්බධිරාකෘතීන් - පුංසඃ පරීක්ෂිතාන් ප්‍රාඥාන් ක්‍ෂුත්පිපාසාශ්‍රමක්‍ෂමාන්' 'අමාත්‍යෙෂු ච සර්වේෂු මිත්‍රෙෂ විවිධෙෂු ච - පුත්‍රෙෂු ච මහාරාජ පණිදධ්‍යාත් මහාමතිඃ' **(මහාභාරතය, (ශාන්ති පර්වය), (වර්ෂයක් සඳහන් නොවේ): අධ්‍යාය 69. ශ්ලොක 8, 9)** අඥානත්වය ප්‍රදර්ශනය කරමින් සමාජයේ හැසිරෙන චරිත, ඇස් නොපෙනෙන නමුත් ශ්‍රවණය කිරීමේ හැකියාව සහිත පිරිස්, බිහිරන් සේ රඟ දක්වන්නවුන්, ක්‍ෂුදා ගින්නෙන් පීඩිත වූවන් සේ හැසිරෙන නමුත් බුද්ධියෙන් මෙන් ම පරීක්ෂාකාරිත්වයෙන් අනූන පිරිස් චරපුරුෂ සේවයේ යෙදවීම වඩාත් ප්‍රතිඵල දායක බව ඉහත මූලාශ්‍රය විග්‍රහයෙන් පැහැදිලි වෙයි. මේ කියනු ලබන චරිතයන්ට අමතර රාජ්‍යයෙහි අමාත්‍ය මණ්ඩලය නියෝජනය කරන්නවුන්, විවිධ මාදිලියේ මිතුරන් මෙන් ම පුත්‍රයන් ද තත් කාර්යයෙහි යෙදවීම වඩාත් සුදුසු බව මූලාශ්‍රයෙන් කියැවේ. සිය සමීපතමයන් චරපුරුෂයන් ලෙස යෙදවීමෙහි මූලික අපේක්ෂාව විශ්වසනීය තොරතුරු එක්රැස් කර ගැනීමයි. පාලකයා මේ ආකාරයෙන් සිය සමීපතමයන් චරපුරුෂ සේවයේ යොදවන්නේ නම් ඔවුන් පත් කළ යුත්තේ එකෙක් අනෙකා නොදන්නා පරිදිය. එකිනෙකා නොහඳුනා ගැනීමේ වාසිය වෙනෙකක් නොව එකිනෙකා පිළිබඳව මෙන් ම විවිධ ක්ෂේත්‍රයන්හී නිවැරදි බුද්ධි තොරතුරු රජුට ලැබීමයි.

සමාහර්තෘ; ජනපදයේ සිටින තපස්වරුන්, සන්‍යාසීන්, ඉන්ද්‍රජාලිකයන්, සිය කැමැත්තෙන් සංචාරය කරන්නවුන්, ශකුන විද්‍යාව දන්නවුන්, ජ්‍යොතිෂඥයන්, වෛද්‍යවරුන්, උන්මත්තකයන්, බිහිරන්, මෝඩයන්, ව්‍යාපාරිකයන්, නළුවන් ආදි වේෂයන්ගෙන් චරපුරුෂයන් යෙදවිය යුතු බව **(අර්ථශාස්ත්‍රය, (අධිකාර 4), 2003: අධ්‍යාය 4. ශ්ලෝක 3)** කෞටිල්‍යගේ අදහසයි. මෝඩ හා බිහිරන් යන වේෂධාරීන් චරපුරුෂයන් ලෙස යොදා ගැනීම ඉහත මූලාශ්‍රය ද්විත්වය ම අනුමත කරයි. සමාහර්තෘගේ කාර්යභාරය භාණ්ඩාගාරයේ සුංකම් හෙවත් බදු එකතු කිරීමයි. ඔහුට චරපුරුෂයන්ගේ ද සහාය ලැබෙන අතර අයබදු වශයෙන් ලැබෙන මුදල් සොරකම් කරන්නේ නම් ඒ පිළිබඳ තොරතුරු රජුට සැපයිය යුතු ය. ඉදින් ඔහු කැමති නම් ජනපදයේ සිටින තපස්වරු, සන්‍යාසීන්, ඉන්ද්‍රජාලිකයින්, සංචාරකයන්, ජ්‍යොතිෂඥයන්, වෛද්‍යවරු, උන්මත්තකයන්,

ව්‍යාපාරිකයන් චරපුරුෂයන් ලෙස යෙදවිය හැකිය. මෙම වේෂධාරී චරපුරුෂයන් සමාජයේ විවිධ තත්ත්වයන් මෙන් ම විවිධ සමාජමය පසුතල නියෝජන කරන බැවින් විවිධ ක්ෂේත්‍ර සම්බන්ධ බුද්ධි තොරතුරු රැසක් අනාවරණය කරගැනීමේ වාසිය අත්පත් කර ගනියි.

කෞටිල්‍යට අනුව කාපටික, උදාස්ථිත, ගෘහපතික, වෛදේහක, තාපස, සත්‍රී, තීක්ෂ්ණ, රසද, භික්ෂුකී 'කාපටි කෞදාස්ථිතගෘහපතික වෛදෙහකතාපස - ව්‍යංජනාත්සත්‍රිතීක්ෂ්ණාරසදභික්ෂුකීශ්ච' (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 11. ශ්ලෝක 01) යනුවෙන් චරපුරුෂයන් නව දෙනෙකු විද්‍යමාන වේ.

- ★ **කාපටිකඃ;** යනු ජනතාවගේ රහස් දැන ගැනීමෙහි මනා චතුරත්වයක් පෙන්වන, ශිෂ්‍යයෙකුගේ වේෂයෙන් සිටින්නා ය. 'පරමමර්මඥඃ ප්‍රගල්භඃ ඡාත්‍රඃ කාපටිකඃ' (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 11. ශ්ලෝක 3) රජුට හා ඇමැතිවරුන්ට සිදුවන හානිය දැක ඒ පිළිබඳව හැඟීම් ලබාදීම ඔහුට පැවරුණු වගකීමයි.
- ★ **උදාස්ථිත;** සන්‍යාසි වේෂයෙන් සිටින බුද්ධිමත්, පිවිතුරු චරපුරුෂයා මෙනමින් හැඳින්වේ. 'ප්‍රව්‍රජ්‍යාප්‍රත්‍යවසිතඃ ප්‍රඥාශෞචයුක්තො' (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 11. ශ්ලෝක 6) කෘෂි කටයුතු, වෙළෙඳාම, සත්ත්ව පාලනය ආදි කටයුතු සිදුවන ස්ථානවල කාර්‍ය සැපයීම මොහු අතින් සිදු විය.
- ★ **ගෘහපතික;** පිවිතුරු සිතක් ඇති, බුද්ධිමත්, නිර්ධන ගොවියෙකුගේ වේෂයෙන් සිටින්නා ගෘහපතික නම් වේ. '........ ගෘහපතිකව්‍යංජනඃ' (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 11. ශ්ලෝක 12) කෘෂිකර්මය සඳහා නිශ්චිත තැන්වල කෘෂි කර්මාන්තයත් වෙළෙඳාම හා සත්ත්ව පාලනය කරවීම මොහුට පැවරුණු කාර්යයන් ය.
- ★ **වෛදේහක නැතහොත් ව්‍යාපාරී;** පිවිතුරු හදවතක් ඇති, බුද්ධිමත්, ධනහීන, ව්‍යාපාරිකයෙකුගේ වෙසින් සිටින තැනැත්තා මෙනමින් හඳුන්වා ඇත. 'වණිජකො වෘත්තික්ෂීණඃ ප්‍රඥාශෞචයුක්තො වෛඬෙහකව්‍යංජනඃ' (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 11. ශ්ලෝක 14)



- ★ **තාපස;** මුඩු කළ හෝ ජටාධාරී වේෂයෙන් සිටිමින් ජීවිකාව සඳහා කටයුතු කරන චරපුරුෂයා මෙනමින් හැඳින්වේ. 'මුණ්ඩො ජටිලො වා වෘත්තිකාමස්තාපස ව්‍යංජනඃ' (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 11. ශ්ලෝක 15) නගරයට සමීප ස්ථානයක වාසය කරමින්, සිය ශිෂ්‍යයන් සමඟ සම්මාන ලබමින්, අනාගතයේ සිදුවිය හැකි දෑ විස්තර කරමින්, ලබාගත් සියලු තොරතුරුවලින් රජු අවදි කරලීම ඔහුට පැවරුණු කාර්යභාරයයි.
- ★ **සත්‍රි;** (ස්ත්‍රී) මොහු රජුගේ සමීපතමයෙක් වන අතර ඔහු රජු ම පෝෂණය කරයි. හස්තරේඛා ශාස්ත්‍රය, ව්‍යාකරණාදි සයවැදෑරුම් අංග, වශීකරණ, ඉන්ද්‍රජාලවිද්‍යා, මන්ත්‍රවිද්‍යා, ධර්මශාස්ත්‍ර, කාමශාස්ත්‍ර, සංගීතශාස්ත්‍ර ආදිය පිළිබඳ දැනුම් ඇත්තෙකි. (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 12. ශ්ලෝක 1)
- ★ **තීක්ෂ්ණ;** සිය ජනපදයේ සිටින ශූරවීර තැනැත්තෙකි. සිය ශරීරය පිළිබඳව අල්ප හෝ තැකීමක් නොකර කටයුතු කරයි. ධනය ඉපයීමේ අර්ථයෙන් ඇත්, ව්‍යාඝ්‍රාදි හිංසාකාරී සතුන් සමීපයේ තබාගනී. (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 12. ශ්ලෝක 3)
- ★ **රසද;** මොහු සිය නෑදෑයින් පිළිබඳව කිසිම ආකාරයේ සෙනෙහෙසක් නොදක්වන, දැඩි ක්‍රෑර, අලසයෙකු ලෙස හඳුනාගත හැකිය. (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 12. ශ්ලෝක 4)
- ★ **භික්ෂුකී;** කිසියම් ස්ත්‍රියක් සිය ජීවිකාව සපුරා ගැනීම සඳහා, දිළිඳු, ප්‍රෞඪ, වැන්දඹු බැමිණියක් ආදි වශයෙන් වෙස් ගනිමින්, අන්තඃපුර ස්ත්‍රීන්ගේ ආදර සත්කාර ලබමින්, ප්‍රධාන මන්ත්‍රිවරුන්ගේ ගෙවල්වලට යාම් ඊම් කරමින් තොරතුරු රැස් කරයි. (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 12. ශ්ලෝක 6)

ඉහත සඳහන් කළ චරපුරුෂයන් කොටස් දෙකකට වර්ග කරන කෞටිල්‍ය පළමු පස් දෙනා සංස්ථා චරපුරුෂයන් ලෙසත් අවසන් හතර දෙනා ස්ත්‍රි චරපුරුෂයන් ලෙසත් වර්ග කර දක්වයි. එක ම තැනක සුළු පිරිසක් සමඟ සිටිමින් සංස්ථාවක ආකාරයෙන් රාජකාරි

කිරීම පළමු කණ්ඩායමෙන් පිළිබිඹු වන අතර ස්ත්‍රී චරපුරුෂයන්ගේ කාර්යයන් සෑම තැනක ම සංචාරය කරමින් සිදු කෙරුණි. චරපුරුෂ කාර්යයන් සඳහා ස්ත්‍රීන් ද යොදාගත් බව මෙයින් ප්‍රකට වන අතර විශේෂයෙන් ඔවුන් සිය මන්ත්‍රී පර්ෂදයේ හා අන්තඃපුර ස්ත්‍රීන්ගේ රහස් සොයා ගැනීම සඳහා යොදවා සිටි බව පෙනේ. චරපුරුෂ ස්ත්‍රීන්ගේ මාර්ගයෙන් දැන ගන්නා තොරතුරු සංස්ථාවේ සිටින පස්වැදෑරුම් චරපුරුෂයන්ට යවනු ලබන අතර සංස්ථාවේ අය සිය සංකේත අනුව ලියන ලද ලිපි මගින් එම තොරතුරු රජු වෙත යැවූ බව අර්ථශාස්ත්‍රයේ එන සඳහනකින් තහවුරු වෙයි. (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 12. ශ්ලෝක 12) ඉහත සඳහන් කළ විවරණයෙන් චරපුරුෂයන්ගේ වේෂයන්, ඔවුන් යෙදවිය යුතු ස්ථාන හා ඔවුන්ගෙන් ලබාගත යුතු තොරතුරු මෙන් ම චරපුරුෂයාගේ ගති ලක්ෂණ හා ගුණාංග කවරේද යන්න හඳුනාගත හැකිය. ඊට අමතරව බුද්ධි තොරතුරු ක්‍රියාත්මක වූ ආකාරය මෙන් ම අවසානයේ රජු අතට එය පත් වූ ආකාරයත් පිළිබිඹු වේ.

'........ පඤ්චවර්ගං ච චෙෂ්ටිතම්' යනාදි මනුස්මෘතියේ එන පාඨයට අනුව (මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය, 2001: සත්වන අදියර. ශ්ලෝක 155) කාපටිකඃ, උදාස්ථිත, ගෘහපතික, වෛදේහක හා තාපස යනුවෙන් චරපුරුෂයන් පස් දෙනෙකු වේ. මෙම පස්දෙනාගේ කාර්යභාරයත්, හැසිරීම් රටාවත් කෞටිල්‍ය දක්වා ඇති කාපටිකඃ, උදාස්ථිත, ගෘහපතික, වෛදේහක හා තාපස යන චරපුරුෂයන් අතර කිසිඳු වෙනසක් නැති බව දක්වා ඇති පඤ්ඤාකිත්ති හිමියන්ගේ අදහසයි. (පඤ්ඤාකිත්ති හිමි, 2001: 73, 74)

ඉහත සඳහන් කළ විවිධ වේෂධාරී චරපුරුෂයන් රජතුමාගේ මලල ක්‍රීඩා ස්ථාන, වෙළඳ පළ, විහාරස්ථාන, සාමාජික උත්සව, භික්ෂුක, මල්වතු, බාහිර වතුපිටි, විද්වතුන්ගේ සභාස්ථාන, අධිකාරියේ නිවාසස්ථාන, සිවුමංසන්ධි, රාජසභා, ධර්මශාලා හා ප්‍රධාන පුද්ගලයන්ගේ ගෘහ 'චරාංශ්ච විද්‍යාත් ප්‍රහිතාන් පරෙණ භරතර්ෂභ - ආපණේෂු විහාරෙෂු සමාජේෂු ච භික්ෂුෂු' 'ආරාමේෂු තථොද්‍යානේ පණ්ඩිතානාං සමාගමේ - දෙශේෂු චත්වරෙ චෛව සභාස්වාවසථෙෂු ච' (මහාභාරතය, (ශාන්ති පර්වය), (වර්ෂයක් සඳහන් නොවේ) අධ්‍යාය 69. ශ්ලෝක 11, 12) යන ස්ථානවල යොදවා බුද්ධි තොරතුරු රැස්කර



කරගත යුතු ය. සතුරු පක්ෂය ද මේ කියනු ලබන ස්ථානවල සිය චරපුරුෂයන් ස්ථානගත කළ යුතු බව මූලාශ්‍රයේ සඳහන් වේ. මෙවැනි ස්ථානවලට විවිධ මාදිලියේ සමාජ කණ්ඩායම් එක්වන බැවින් ඔවුන් අතර ගැවසීමෙන්, සාකච්ඡා කිරීමෙන් හා සංවාද කිරීමෙන් විවිධ මාදිලියේ තොරතුරු රැස් කරගත හැකිය.

සිය සතුරන් ජයග්‍රහණය කිරීමට නම් පාලකයා ඒ සඳහා යෙදවිය යුත්තේ තමාට වඩාත් සමීප, ප්‍රධාන තැනැත්තෙක් ය. පාලකයා වෙනුවෙන් චරපුරුෂ සේවයේ යෙදෙන එම තැනැත්තා සතුරා හා මිතුරු වී ඔහුගේ විශ්වාසය දිනා, කපටිකමින් සිය පක්ෂය වෙත පොලඹවා ගත යුතු යැයි (අර්ථශාස්ත්‍රය, (අධිකාර 13), 2003: අධිකාර 13. අධ්‍යාය 3. ශ්ලෝක 1, 2) කෞටිල්‍ය සඳහන් කරයි. සතුරන්ගේ රාජ්‍යයන් වෙත ප්‍රවේශය වන චරපුරුෂයන් පිළිබඳව තව දුරටත් කරුණු දක්වන කෞටිල්‍ය, චරපුරුෂයා සතුරාගේ භාණ්ඩාගාරය, සේනාව, ඇමැතිවරු ආදි සියල්ලන් විනාශ කොට, ඔවුන්ගේ බලකොටු ද වැටලීමට කටයුතු සම්පාදනය කළ යුතු යැයි අවධාරණය කරයි. මෙසේ කරුණු දක්වන අර්ථශාස්ත්‍රය ම එවැනි අවස්ථාවන්හී දී ජනපදයත් එහි වැසියනුත් සුරක්ෂිත කිරීමට වගබලා ගත යුතු යැයි සඳහන් කර ඇත. (අර්ථශාස්ත්‍රය, (අධිකාර 13), 2003: අධිකාර 13. අධ්‍යාය 4. ශ්ලෝක 1, 2)

විවිධ උපක්‍රමයන්ගෙන් බුද්ධි තොරතුරු රැස් කරන පාලකයා තමා මෙන් ම සිය රාජ්‍යය සුරක්ෂිත කර ගැනීම සඳහා කටයුතු සංවිධානය කළ යුතු ය. මේ පිළිබඳව උපදෙස් දෙන භාරතීය මූලාශ්‍රය; යම් විටෙක රජු සිය පක්ෂය දුර්වල, බෙලහීන යැයි තේරුම් ගතහොත්, එවිට බුද්ධිමත් රජු මන්ත්‍රීන් සමඟ සාකච්ඡා කොට බලවත් සතුරා සමඟ සමගි විය යුතු ය. මේ පිළිබඳව තව දුරටත් කරුණු දක්වන මූලාශ්‍රය; ගුණවත්, සදා උත්සාහය පෙරදැරි කරගත්, ධර්මය දත් සාධුවරයන්ගේ සහායෙන් ධර්ම පූර්වකව රට පාලනය කරන පාලකයෙක් වේ ද ඔහු බලවතුන් සමඟ සමගිව කටයුතු කළ යුතු යැයි සඳහන් කර ඇත. (මහභාරතය, (ශාන්ත පර්වය 1 කොටස), 2006: අධ්‍යාය 69. පි. 199) විවිධාකාර වූ චරපුරුෂයන්ගෙන් රැස් කරගනු ලබන බුද්ධි තොරතුරුවලට අනුකූල වන පාලකයා කළ යුතු ප්‍රථම කාර්යය වනුයේ සිය සතුරාගේ අදහස් විනාශ කිරීම හා නිෂ්ඵල කිරීමයි. සතුරාගේ

අදහස් විනාශ කරන පාලකයා ප්‍රබල පාලකයන් සමඟ සමගි වෙමින් සිය රාජ්‍යය සුරක්ෂිත කර ගැනීමට ද කටයුතු කළ යුතු බව මූලාශ්‍රයෙන් කියැවේ. බලවතුන් සමඟ සමගි බව ඇති කරගන්නා අතර ම බුද්ධිමත් රජු තමාට අපකාර කළ අය ද සම්පූර්ණයෙන් විනාශ කර දැමිය යුතු යි. යම් රජ කෙනෙක් කිසියම් ආකාරයකින් උපකාර හෝ අපකාර කිරීමට සමත් නොවුව හොත් ඔහු විනාශ කර දැමීම උචිත නොවන බවත් ඔහු කෙරෙහි උපේක්ෂාව දැක්විය යුතු බවත් මූලාශ්‍රයේ සඳහන් වේ. (**මහභාරතය, (ශාන්ත පර්වය 1 කොටස), 2006: අධ්‍යාය 69. පි. 199**)

රාජ්‍යයක් තුළ යහපත් පාලනයක් ගොඩනැගීමට හැකි වනුයේ අනුශාසනා පෙරදැරිව මිස හිතුවක්කාර ලෙස නොවේ. යහපත් පාලනයක් සහිත රාජ්‍යයක් ගොඩනැංවීමට උපස්ථම්භක වනුයේ ධනය, සේනාව හා සුදුසු පුද්ගලයන් නියමාකාරයෙන් සුදුසු කාර්‍යයන්හී යෙදවීමෙන් පමණි. පාලකයා කෙතරම් යහපත් අයෙකු වූයේ නමුත් ඔහුගේ සහචරයන් අයහපත් නම් එම රාජ්‍යයේ පරිහානිය කවරෙකුටත් වැළැක්විය නොහැකිය. තමාගේ මෙන් ම රාජ්‍යයේ පරිහානියට සිය සමීපතමයන්ගේ ක්‍රියාකාරකම් බෙහෙවින් බලපාන බැවින් සිය චරපුරුෂයන් මගින් මැති ඇමැතිවරුන්ගේ සහ අධිකාරීන් ආදි කොට ඇති සියලු නිලධාරීන් පරීක්ෂා කළ යුතු යැයි **අර්ථශාස්ත්‍රයේ** සඳහන්ව ඇත. මේ පිළිබඳව තව දුරටත් කරුණු දක්වන කෞටිල්‍ය රජ කුමරා වූ සිය පුත්‍රයා වුව ද අයහපත් දේ කරන්නේ නම් ඔහුට දඬුවම් කළ යුතු බවත්, එබඳු පුත්‍රයන් චරපුරුෂ සේවය යොදවා ආයුධය එනම් විෂ ආදි රසවලින් මරා දැමීම වඩාත් උචිත වන බවත් අවධාරණය කරයි. '....... ත්‍යක්ත ගූඪපුරුෂාඃ ශස්ත්‍රරසාභ්‍යාං හන්‍යුඃ' (**කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 18. ශ්ලෝක 14**) ලැබෙන බුද්ධි තොරතුරු නිවැරදි නම් රාජ්‍යයේ යහපැවැත්ම සඳහා සිය පුත්‍රයා වුව මරා දැමීම වැරැදි නොවන බවත් ඒ සඳහා භාවිත කළ යුතු සුදුසු ම පිරිස චරපුරුෂයන් බවත් මෙයින් පැහැදිලි කෙරේ.

විවිධ නිලධාරීන් විෂයෙහි රාජකාරීන් පවරාදීමෙන් පසුව ඔවුන්ගේ කාර්යයන් නිවැරදිව සිදු වන්නේ ද යන්න චරපුරුෂයන් යොදවා සොයා බැලීම පාලකයා සතු වගකීමකි. චරපුරුෂයන් ලබාදෙන විවිධ



තොරතුරු පාලකයාගේ කාර්යයන් පහසු කරන බැවින් **අර්ථශාස්ත්‍රය** චරපුරුෂයන් පාලකයාගේ ඇස ලෙස වර්ණනා කර ඇත. '.......... චාරෛඃ පශ්‍යන්ති රාජානශ්චක්ෂුභ්‍යාං ඉතරෙ ජනාඃ' (**කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 19**)

## රහස් සාකච්ඡා කළ යුතු ස්ථාන, බැහැර කළ යුතු පිරිස් හා තොරතුරු හෙළි කරන්නන්ට නියමිත දඬුවම්

ඉහත දී සාකච්ඡාවට ලක් කළ කරුණුවලට අමතරව බුද්ධි තොරතුරු විශ්ලේෂණය කළ ආකාරයත්, ඒ සඳහා සාකච්ඡා කළ යුතු ස්ථාන, කාලය හ බැහැර කළ යුතු පිරිස් ආදි කරුණු ද පෙරදිග මූලාශ්‍රය ඇසුරෙන් විමසිය හැකිය. **අර්ථශාස්ත්‍රයේ** එන විස්තරයන්ට අනුව රජතුමා චරපුරුෂයන් හමුවිය යුතු වන්නේ රාත්‍රියේ පළමු යාමයේදී ය. එසේ හමු වී රාත්‍රියේ සප්තම කොටසේ එනම් උදෑසන රහස් වාර්තා කියවා අවශ්‍ය තැන්වලට චරපුරුෂයන් යොමු කළ යුතු ය (**අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 19. ශ්ලෝක 18 - 22**). රාජ්‍යයේ සාකච්ඡා පිළිබඳව අවධානය යොමු කරන කෞටිල්‍ය මැති ඇමැතිවරු, චරපුරුෂයන්, දූත ආදි කවරෙකු සමඟ හෝ රහස් සාකච්ඡා කරන්නේ ද එම සාකච්ඡා ඉතා ඕනෑකමින් රහස් සුරැකෙන ආකාරයෙන් ම කළ යුතු යැයි අවධාරණය කරයි. මෙම සියලු දෙනා සමඟ කරනු ලබන රහස් සාකච්ඡා රාජ්‍යයේ ආරක්ෂාවට අතිශයින් වැදගත් වන බැවින් එම රහස් කිසි විටෙකත් සතුරු පක්ෂයට හෝ සාමාන්‍ය ප්‍රජාවට දැන ගැනීමට අවකාශ සලසා නොදිය යුතු ය.

කිසියම් ස්ථානයක රහස් සාකච්ඡා සිදු වන්නේ නම් එම ස්ථානය සතර පැත්තෙන් වසා දැමිය යුතු බවත් අන්‍යෝන්‍ය මන්ත්‍රණ එම ස්ථානයෙන් පිටතට නොයෑම සඳහා වගබලා ගත යුතු බවත් අවධාරණය කරන **අර්ථශාස්ත්‍රය** මේ ආකාරයේ වූ සාකච්ඡා වෙන අයෙකුට තබා අවම වශයෙන් සිය පාක්ෂිකයෙකුට වුව නොදැකිය හැකි තැනක සිදු කළ යුතු යැයි අවධාරණය කර තිබේ (**අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 15. ශ්ලෝක 3, 4**). ඉහත මූලාශ්‍රය විස්තරයට අනුව පැහැදිලි වනුයේ රාජ්‍ය රහස් අදාළ පුද්ගලයන් සමඟ පමණක් ම සිදු කළ යුතු බව ය. අතීතයේ විවිධ කාලපරිච්ඡේදයන්හී ගිරවුන්, සැළලිහිණි ආදි සතුන් පවා රජුගේ රහස් සාකච්ඡා හෙළි කළ බවත්, සුනඛාදි සතුන් ද මන්ත්‍රණ හෙළි කිරීමට සහාය වූ බැවින් එවැනි

සත්ත්ව කොට්ඨාස සමීපයේ දී ද රහස් සාකච්ඡා උචිත නොවන බව කෞටිල්‍යගේ අදහසයි (කෞටිල්‍ය අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 15. ශ්ලෝක 3, 4).

රහස් සාකච්ඡා පිළිබඳව තව දුරටත් කරුණු දක්වන කෞටිල්‍ය සාකච්ඡා සිදුවන ස්ථානවලට රාජාඥාවකින් තොරව, කිසිඳු පුද්ගලයකුට ප්‍රවේශ වීමට ඉඩ නොදිය යුතු බවත්, පාලකයා විසින් පත්කළ අයෙකුට පමණක් එහි සිටීමට අවසර ඇති බවත් සඳහන් කරයි. ඉදින් කිසියම් අයෙක් රහස් හෙළි කරන්නේ නම් ඔහුගේ හිස සිඳීම අනිවාර්යයෙන් ම සිදු කළ යුතු බවත් කෞටිල්‍යගේ ඉගැන්වීමෙන් පැහැදිලි වේ (අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), 2003: අධිකාර 1. අධ්‍යාය 15. ශ්ලෝක 6). රහස් සාකච්ඡා රාජ්‍යයේ ස්ථාවරත්වයට අතිශයින් ම වැදගත් වන බැවින් එයට සම්බන්ධ වන දූතයින්, ආරක්ෂකයින්, චරපුරුෂයන් හා මැති ඇමැතිවරු ආදි සියලු දෙනා රාජ්‍ය රහස් සුරැකීමට අනිවාර්යයෙන් ම බැඳී සිටිය යුතු බවත් ඉදින් කිසියම් ආකාරයකින් රාජ්‍ය රහස් හෙළිවන්නේ නම් එයින් රාජ්‍යයත් බුද්ධි තොරතුරු ලබා දුන් පිරිසත් විනාශයට පත්වෙන බවත් මෙයින් කියැවේ.

## සමාලෝචනය

අන්තර් භූ රාජ්‍ය දේශපාලන සබඳතා වර්ධනය කරගැනීමේදී දූතයාට සුවිශේෂිත වැදගත්කමක් හිමි වී ඇති බව පෙනේ. මෙම නිලය සාමාන්‍ය චරිත ඇත්තවුන් කෙරෙහි නොව රාජ්‍ය පරිපාලනය පිළිබඳ පෘථුල දැනුමක් හා ඒ පිළිබඳ කුසලතාවලින් පිරිපුන් අය කෙරෙහි ම ලබාදිය යුතු නිලයකි. භාරතීය සංස්කෘත මූලාශ්‍රය පෙන්වා දෙන ආකාරයට එම නිලයට පත්වන තැනැත්තා සමස්ත රාජ්‍යයේ සියලු ක්ෂේත්‍ර පිළිබඳ පෘථුල දැනුමකින් සන්නද්ධ විය යුතු ය. සංස්කෘත සාහිත්‍යය මූලාශ්‍රය දූතයා සම්බන්ධයෙන් එවැනි නිගමනයකට එළඹෙනුයේ එම නිලය සමස්ත රාජ්‍යය ම නියෝජනය කරන නිලපද්ධතියක් වන බැවිනි. මූලාශ්‍රයට විස්තරයන්ට අනුව දූත නිලයට පැවරුණු ප්‍රධාන කාර්යය වූයේ සන්ධි හා විග්‍රහ මගින් එකිනෙක රාජ්‍යයන් අතර මෙන් ම පුද්ගල කණ්ඩායම් අතර සමගි සන්ධාන හා භේද භින්නතා වර්ධනය කිරීමයි. එම ප්‍රධාන කාර්යයට අමතරව



මිතුරු, සතුරු හා අසල්වැසි රාජ්‍යයන්හී විවිධාකාර වූ දුර්වලතා ආදිය නිරීක්ෂණය කොට වාර්තා සැපයීම ද ඔහුට පැවැරණු රාජකාරියකි. මූලාශ්‍රය විග්‍රහයන්ට අනුව අන්තර් සබඳතා වර්ධනය කිරීමට පමණක් නොව භාණ්ඩාගාරයේ අභිවෘද්ධිය සඳහා ද දූතයා කටයුතු කළ යුතු ය. ඉහත සඳහන් කළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් දූතයාගේ වාර්තා සැපයීම පාලකයාගේ අනාගත ක්‍රියාකාරකම්වලට බෙහෙවින් ඉවහල් වන බැවින් අන්තර් රාජ්‍ය සබඳතාවලදී දූත කාර්යය සඳහා තෝරාගත යුතු වන්නේ පාලන සංවිධානයේ සියලු ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් අවබෝධයක් මෙන් ම දැනුමක් ඇති තැනැත්තන් පමණක්ය යන්න මූලාශ්‍රය අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

රාජ්‍ය ආරක්ෂාව ගොඩනැගීමේ ප්‍රධාන වගකීම චරපුරුෂ සේවය හා සම්බන්ධ වන බැවින් ඔවුන් රජුට හා රාජ්‍යයට වඩාත් පක්ෂපාති වෙමින් තොරතුරු එක්රැස් කළ යුතු ය. එසේ එක්රැස් කරගත් කරුණු දවසේ අළුයම් කාලයේ රජු සමඟ සාකච්ඡා කරමින් ආරක්ෂාව සම්බන්ධයෙන් තීන්දු තීරණවලට එළඹිය යුතු ය. ඔවුන්ගේ සේවය රාජ්‍ය සංවිධානයට අතිශයින් වැදගත් වන බැවින් පාලකයා එම ක්ෂේත්‍රයට වැඩි අවධානයක් යොමු කළ යුතු බව මූලාශ්‍රය නිගමනයයි. රාජ්‍ය නමැති ආයතනයේ සුරක්ෂිත බව චරපුරුෂයන්ගේ බුද්ධි තොරතුරු මත යැපුණු බැවින් ඔවුන්ට ද රාජ්‍ය පාලන සංවිධානය තුළ විශාල පිළිගැනීමක් තිබුණු බව දක්නට පුළුවන. බුද්ධි තොරතුරු ලබා ගැනීමට චරපුරුෂයෝ විවිධාකාර වූ වේෂයන්ගෙන් ජනයා වඩාත් එක්රැස් වෙන ස්ථානයන්හී පෙනී සිටියහ. තොරතුරු ලබාගැනීම සඳහා ඔවුන් අනුගමනය කළ වේෂධාරිත්වය අති විශිෂ්ට වූවකි. බුද්ධි තොරතුරු සාකච්ඡා කිරීම ඉතා රහසිගතව, අදාළ අය සමඟ ම සිදු කළ යුතු බවත් රහස් හෙළි කරන්නන්ට දැඩි දඬුවම් ලබාදිය යුතු බවත් මූලාශ්‍රය අවධාරණය කර තිබේ. ඉහත සඳහන් කළ මූලාශ්‍රය විස්තරයන්ට අනුව රාජ්‍ය නමැති ආයතනයේ බොහෝ නිලධාරීන් අතර අන්තර් රාජ්‍ය සම්බන්ධතා ගොඩනගන දූතයාටත්, බුද්ධි තොරතුරුවලින් රජුත් රාජ්‍යත් සුරක්ෂිත කරන චරපුරුෂයාටත් සුවිශේෂිත වැදගත්කමක් හිමිව තිබූ පැහැදිලිය.

03000

## ආශ්‍රිත ග්‍රන්ථ

**අර්ථශාස්ත්‍රය**, (අධිකාර 1-2), (2003). අනු. හිරිපිටියේ, පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**අර්ථශාස්ත්‍රය**, (අධිකාර 3 - 4 - 5 - 6 - 7), (2003). අනු. හිරිපිටියේ, පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**අර්ථශාස්ත්‍රය**, (අධිකාර 13), (2003). අනු. හිරිපිටියේ, පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය**, (2001). පරි. සෙනෙවිරත්න, නාගොඩ ආරියදාස, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**මහාභාරතය**, (ශාන්ති පර්වය 1 කොටස), (වර්ෂයක් සඳහන් වේ). ගෝරඛපුර: (ඉන්දියා) හනුමානප්‍රසාද පෝද්දර ප්‍රකාශන, මූලාශ්‍රය අන්තර්ජාලය.

**මහාභාරතය**, (ශාන්ති පර්වය 1 කොටස), (2006). පරි. හිරිපිටියේ, පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**ශුක්‍රනීතිසාරය**, (1, 2, 3, 4), (1952). සංස්. ඛේමරාජ - ශ්‍රී කෘෂ්ණදාස, කතෘ ප්‍රකාශනයකි, (ඉන්දියා)

## ද්විතීයික මූලාශ්‍රය

අල්ටේකාර්, ඒ. එස්., (2004). **පැරණි ඉන්දියාවේ රාජ්‍ය සහ ආණ්ඩුව**, පරි. අබේරත්න, ඩී. ඇල්. නුගේගොඩ: සමන් ප්‍රකාශකයෝ.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, (2001). **පුරාතන භාරතීය පාලන මූලධර්ම**, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

30 OCT 2023
පුස්තකාලය

00060